# ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ඉතිහාසය

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය පිහිටුවනු ලැබුවේ යටත් විජිත යුගයේදී යි. 1943 දී නිල වශයෙන් එය පිහිටුවනු ලැබුවද, එහි මුල් ආරම්භය 1930 ගණන් දක්වා ඈතට දිවයයි. සමාජවාදී පක්ෂයක අවශ්‍යතාවය ගැන සිතූ අපේ ව්‍යාපාරයේ පූරෝගාමී නායකයෝ, පූර්ණ නිදහස සඳහා වූ අරගලය හරහා, විවිධ අවධීන් තුළින් ක්‍රමානුකූලව පක්ෂය ගොඩනැගූහ.

කොළඹ තරුණ සංගමය (1929), සමස්ත ලංකා තරුණ සම්මේලනය (1931), සූරිය මල් ව්‍යාපාරය (1933) ලංකා සමසමාජ පක්ෂය (1935), කොළඹ කම්කරු සමාජය (1940), සමාජවාදී එක්සත් පක්ෂය (1940) සහ ලංකා කොමියුනිස්ට් පක්ෂය (1943) එම අවධීන් ය.

මේ සඳහා මුල සිටම වාගේ සම්බන්ධ වූ සහෝදරවරු තිදෙනෙකි. ඒ දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ, එම්.ජී.මෙන්ඩිස් සහ ටී.දුරෙයිසිංහම් ය. පීටර් කෙනමන්, ඒ.වෛද්‍යලිංගම්, පී.කන්දයියා, කේ.රාමනාදන්, පී.ශන්කර්, ලයනල් කුලතුංග, කේ.ඒ.සිරිරත්න සහ ඩී.ඩී.ලියනගේ පසු කාලයේදී එක්වූ සහෝදරවරුන්ය.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය නීත්‍යානුකූල මෙන්ම නීති විරෝධී තත්වයන් යටතේ ක්‍රියාකොට තිබේ. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ වසර 47ක් ද, ආණ්ඩු පක්ෂයේ සන්ධාන ආණ්ඩු තුනක් යටතේ වසර 18ක් ද, කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, පරාජයන්, පසුබැසීම්, තහනම් කිරීම් වලට ලක්වී තිබේ. එමනේම, විවිධාකාරයේ බොරු චෝදනා, අවලාද, පහරදීම්, ඝාතනවලට ද ලක්විය. අප පක්ෂය වැරදි සිදු නොවූ පක්ෂයක් නොවේ. සිදුවූ වැරදි පිළිගත්, ඒවා නිවැරදි කරගත්, ඒවා ජනතාව ඉදිරියේ විවෘතව පිළිගත් පක්ෂයකි. ඒ සඳහා අපට අභ්‍යන්තර ශක්තියක් තිබිණි. අපේ පක්ෂය ස්වයං විවේචනය ගුරුකොට ගත් පක්ෂයකි. උපක්‍රම වලදී මෙන්ම ඇතැම් අවස්ථාවල උපාය මාර්ගයේ දී අප අතින් වැරදි සිදුවී තිබේ. එහෙත්, අප කවදාකවත් ත්‍රස්තවාදය වැළඳගත් පක්ෂයක් නොවේ. අපේ අත්වල ලේ තැවරී නැත. දේශපාලන වාසි නොතකා, අප ප්‍රතිපත්තිමය දේශපාලනයේ නිරතවූ පක්ෂයකි.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය කෙදිනකවත් ජාතිවාදයට දායකවූ පක්ෂයක් නොවේ. ඉතිහාසය පුරාම ප්‍රචණ්ඩත්වය, ත්‍රස්තවාදය සහ අරාජිකවාදය පිළිකුල් කළ පක්ෂයකි.

ජාතික ප්‍රශ්නය පිළිබඳව පක්ෂයේ ස්ථාවරය නිවැරදි බව ජීවිතය, ඉතිහාසය විසින් ඔප්පු කොට ඇත. බොහෝ පක්ෂ අප දරණ ස්ථාවරයට ප්‍රමාදවී හෝ පැමිණ තිබීම ගැන අපි සතුටු වෙමු. පක්ෂයේ ප්‍රතිපත්තිමය ස්ථාවරය රැකගන්නට ගොස් නායක මට්ටමේ සහෝදරවරුන් ගණනාවකගේ (උතුරේ මෙන්ම දකුණේ) වටිනා ජීවිත ගණනාවක් පූජා කිරීමට සිදුවූ බව අප සිහිපත් කළ යුතුය.

අපේ රටේ සමාජ සංවර්ධනයේදී වමේ සෙසු සහෝදර පක්ෂ සමග වෙන් වෙන් වශයෙන් මෙන්ම, සාමූහිකව දායකවී තිබේ. අපේම ආණ්ඩුවක් අප නොපිහිටුවද, විපක්ෂයේ සිටිමින් හා සන්ධාන ආණ්ඩුවල කොටස්කරුවන් වශයෙන් අපේ දැනුම, බුද්ධිමය අත්දැකීම්, හැකියාව, චින්තනය, සංකල්පයන් රටේ පොදු යහපත සඳහා දායාද කොට ඇත. අද ශ්‍රී ලංකිකයින් වශයෙන් රටේ සාක්ෂරතාවය, අධ්‍යාපන මට්ටම, සෞඛ්‍ය සේවා සහ සමාජ සුරක්ෂිතතාවය ගැන අපි ආඩම්බරවෙමු. අපි අසල්වැසි රටවලට වඩා ඒ අංශවලින් ඉදිරියෙන් සිටිමු. එය සිදුවූයේ කෙසේ ද? රාජ්‍ය මන්ත්‍රණ සභා දෙකේ සහ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවල පිටු පෙරලුවහොත් ඊට පිළිතුරු සොයා ගත හැකියි. ඒ අපේ වමේ ව්‍යාපාරයේ නායකයින්ගේ දායකත්වයයි.

1930 ගණන්වල සිට, මෙරට කම්කරු පන්තියට,ගොවි ජනතාවට, රජයේ සේවකයින්ට, ගුරුවරුන්ට, කාන්තාවන්ට, තරුණයින්ට, ශිෂ්‍යයින්ට හා දරුවන්ට අයිතීන් බොහෝ සේ ලබා දී ඇත්තෙමු. ඒ අරගල තුළිනි. අප පාසැල් සිසුන්ගේ හැකියාවන් මොට්ට කළේ නැත. විකෘති කළේ

නැත. අපි ඔවුන්ගේ බුද්ධි මහිමය දියුණු කළෙමු. එදා විශ්ව විද්‍යාල උගතුන් බිහි කරන මධ්‍යස්ථාන විය. අද මෙන් ඒවා ත්‍රස්තවාදයට, මුදල් කොල්ල කෑමට, දූෂණයට ගොදුරුවීමට අපේ ශිෂ්‍යයන් ඉඩ නොදුන්හ.

දේශප්‍රේමීත්වය සහ ජාත්‍යන්තරවාදය එකම කාසියේ දෙපැත්ත මෙනි. අපේ ජනතාව තුළ ඒ පිළිබඳ හැඟීම් හා අවබෝධය වර්ධනය කරලීමට කටයුතු කළෙමු. අද ලොවේ සෙසු ජනතාවගේ අරගලවලදී අපේ රටේ ජනතාව සහයෝගතාවය ප්‍රකාශ කරන්නේ එසේ ලබා ගත් අවබෝධය සහ පන්නරය නිසා ය.

සමාජවාදී රටවල ජනතාව සහ අපේ ජනතාව අතර සහෝදරත්වය වර්ධනය කරලීමට අප ඉටු කළ මෙහෙය ගැන ආඩම්බරවෙමු.

ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සංකල්ප, ප්‍රතිපත්ති සහ නීතිමය වශයෙන් දායකවී තිබෙන අතර, . විශේෂයෙන්ම, කාර්මිකරණය, කෘෂිකර්ම නවීකරණය කිරීම, වාරිමාර්ග, බහුවිධ යෝජනා ක්‍රම, පාරිසරය, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස ආදී විෂයන්ටද අප දායකවී ඇත.

අපේ අභිමානවත් ඉතිහාසය පුරා ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩත්වය දැකිය නොහැකිය. අපේ අත්වල ලේ නැතැයි කියා සිටියේ ඒ නිසයි. එය කොමියුනිස්ට්වරුන්ගේ, මාක්ස්වාදීන්ගේ ක්‍රමවේදය නොවේ. ජාතික විමුක්ති ව්‍යාපාරයේ සන්නද්ධ අරගලවලදී පවා, සටනේදී මිය ගියහොත් මිස, සතුරෙකු වුවද ඝාතනය කිරීම තහනම් ය. හිංසා කිරීම තහනම්ය. හොඳම ආදර්ශය වියට්නාම් හා කියුබානු දේශප්‍රේමී අරගලයි. කොමියුනිස්ට්වරුන්ට අවශ්‍ය මිනිසුන් ජීවත්කරවීම මිස මරාදැමීම නොවේ. කොමියුනිස්ට්වරුන් ලොවේ උත්තරීතර මානවවාදීන් වන්නේ එහෙයිනි.

----

ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා මැතිවරණය 1931 පැවැත්විණි. එවකට සෞඛ්‍ය සේවයෙන් රැකියා අහිමිව සිටි දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතා එයට මොරවක ආසනයෙන් ඉදිරිපත්ව ජයග්‍රහණය කළේය. එය සමාජවාදී අදහස් ඇති අයගේ නව පිබිදීමක් ඇතිවිය. ඉන් අනතුරුව, 1933 දී සූරිය මල් ව්‍යාපාරය ආරම්භයත් සමග මාක්ස්වාදී අදහස් දරන්නන් එක්වූහ. එහි ක්‍රමික විකාශනයෙන් පසු, 1938 දෙසැම්බර් 18 වැනි දින දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ඇම්.ජී.මෙන්ඩිස් ආදීන්ගේ මෙහෙයීමෙන් 'ලංකා සමසමාජ පක්‍ෂය' පිහිටුවන ලදි. මේ සමයේ දී සමසමාජ පක්‍ෂයේ සිටි සාමාජිකයින්ගෙන් වැඩි දෙනෙක් මධ්‍යම පන්තිකයෝ වූහ. විවිධ අදහස් දරණ අය වූහ.

1940 දී සමසමාජ පක්‍ෂයේ ප්‍රධාන සාමාජිකයන් කිහිප දෙනෙකු විසින් කොමියුනිස්ට් ජාත්‍යන්තරය හා සෝවියට් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය හෙලාදැකීමට යෝජනාවක් පක්‍ෂයේ කාරක සභාවට ගෙනෙන ලද බැවින් ඒ හා සිදුවුණු මත ගැටීමෙන් පක්ෂයේ ප්‍රධාන පුද්ගලයින් හා කාරක සභිකයින් නෙරපන ලදි.

1940 ජූනි 22 සෙනසුරාදා 'ජනශක්ති' පුවත්පත සඳහන් කළ සමසමාජ පක්ෂයේ කාරක සභාව විසින් පක්ෂයෙන් නෙරපන ලද කාරක සභිකයින් හා සාමාජිකයින් මෙසේ ය.

දොස්තර ඇස්.ඒ.වික්‍රමසිංහ - කාරක සභික
ඇම්.ජී.මෙන්ඩිස් - කාරක සභික (සම ලේකම්)

ඒ.ගුණසේකර - කාරක සභික

ඩබ්.ආරියරත්න - කාරක සභික

කේ.රාමනාදන් - සමධර්ම පත්‍රයේ කර්තෘ (සම ලේකම්)

අයි.ඇම්.ඊබ්‍රහිම් - කාරක සභික

පක්ෂයෙන් නෙරපන ලද සාමාජිකයින් ලෙස උඩකැන්දවල සරණංකර ස්වාමින්වහන්සේ, ඒ.වෛත්‍යලිංගම්, ඇස්.පී.අමරසිංහම්, ඊ.එස්.රත්නවීර, ආනන්ද කුමාර, ආර්.ඒ.ඩී.ජෝෂප්, කුලතුංග හෙට්ටිආරච්චි, කේ.මාධවන්, ජයසේකර, එස්.පියසේන, ඩී.පී.යසෝදිස්, කේ.පී.අමරසිංහම් මාතර ශාඛාවේ භාණ්ඩාගාරික බෙනට් සිල්වා, සමසමාජ පත්‍රයේ කළමනාකාර කාරක සභික හැරල්ඩ් පීරිස් හා මහනුවර ශාඛාවේ සාමාජිකයින් 7 දෙනෙක් පක්ෂයෙන් නෙරපූහ.

ලංකා සමසමාජ පක්ෂයෙන් නෙරපන ලද වික්‍රමසිංහ ප්‍රමුඛ කොමියුනිස්ට්වාදීහු මුලින් කොළඹ අළුත්කඩේ වීදියේ අංක 81 දරණ ස්ථානයේත්, පසුව විල්සන් වීදියේ අංක 37 දරණ ස්ථානයෙත් පිහිටි කම්කරු සමාජ ශාලාවේ තම මූලස්ථානය පිහිටුවා ගත්හ. එහි සිට අධ්‍යයන පන්ති, පුවත්පත් හා සමාජවාදී ප්‍රකාශන නිකුත් කළහ. එහිදී නිකුත් කළ ජනශක්ති පුවත්පත විශාල ජනප්‍රියතාවයක් ඉසිලීය. 1940 නොවැම්බර් මස 13 වැනිදා පෑලියගොඩ දී සම්මේලනයක් පවත්වා 'එක්සත් සමාජවාදී පක්ෂය' පිහිටුවා ගත්හ. එහි ලේකම් ලෙස එම්.ජී.මෙන්ඩිස් පත් කර ගන්නා ලදී. එහි අරමුණ වූයේ ප්‍රභල කම්කරු සංවිධානයක් ගොඩනගා එමගින් නිදහස සඳහා වූ සටන් පංති සටන සමග එකාබද්ධ කිරීම යි. ඒ අනුව ඔවුන් කොළම කම්හල් වල අළුත් වෘත්තීය සමිති 35ක් පමණ සංවිධානය කළහ. ඉන් පසු 1940 දෙසැම්බර් මස 20 හා 22 අතර ලංකා කම්කරු සමිති සම්මේලනය (ලංකා වෘත්තීය සමිති සම්මේලනය) පිහිටුවා ගත්හ. 1941 ජනවාරි 1 දින මෙම සම්මේලනයේ මූලස්ථානය අළුත් කඩේ සිට යුනියන් පෙදෙසේ අංක 211 දරණ ස්ථානයට ගෙන යන ලදී. 1942 මාර්තු 13 දින එක්සත් සමාජවාදී පක්ෂය ආණ්ඩුව විසින් තහනම් කරන ලදී. ඔවුන් පසුව 'ජපන් විරෝධ ප්‍රචාරක මධ්‍යස්ථානය' හා 'කම්කරු අධ්‍යයන කවය' යන නම්වලින් සංවිධාන පිහිටුවා ගත්හ. ඔවුන් අධිරාජ්‍යවාදීන්ගෙන් වෙන්වී ජාතිහිතෛෂී පුළුල් ජන කොටස් සමග එක්වී 'නියම වශයෙන්ම නිදහස සඳහා වූ ව්‍යාපාරයක දියත් කිරීමේ වැදගත් කම අවධාරණය කළහ. 1942 දෙසැම්බර් මස 18 -20 දින වලදී පැවැති ජාතික සංගමයේ සම්මේලනය වෙනුවෙන් නිකුත් කළ පත්‍රිකාවකින් එහි අවශ්‍යතාව දැක්වීය. ඒ අනුව ජාතික සංගමයේ ප්‍රබල සාමාජිකයකු වූ ඩී.එස්.සේනානායකගේ විරුද්ධත්වය නොතකා තම අරමුණ ඩොමීනියන් තත්ත්වය නොව නිදහස ලබා ගැනීම බව කැළණි සම්මේලනය තීරණය කිරීම දේශීය ජාතික ව්‍යාපාරයේ වැදගත් සන්ධිස්ථානයක් විය.

ජාතික සංගමය තුළ ක්‍රියාත්මක වූ කොමියුනිස්ට්වාදීහු 1943 ජූලි මස 2 හා 3 දිනවල බෙරැල්ලේ කෝට්ටේ පාරේ අංක 85 දරණ ස්ථානයේ පැවැති සාකච්ඡා වලින් 'එක්සත් සමාජවාදී පක්ෂය' විසුරුවා හැර 'ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පකෂය' ඇරඹීය. එහි ප්‍රධාන ලේකම් වශයෙන් පීටර් කේනමන් මහතා පත් කර ගන්නා ලදී. එතැන්සිට ලංකා

කොමියුනිස්ට් පක්ෂය ලංකාවේ සෝෂලිස්ට් ව්‍යාපාරය වෙනුවෙන් පෙනී සිටී. එය පෙර පැවැති පාරම්පරික ව්‍යාපාරයේ අගනා පුරාවෘත්තිය නොකඩවා ඉදිරියට ම ගෙන යයි.

කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන පරමාර්ථය වූ කලී සෝෂලිස්ට් ලංකාවක් ඇති කිරීමයි. එවැනි සමාජයක ඇතිවන ප්‍රධාන අංග නම් මේවා ය.

(අ) ධනේෂ්වර ක්‍රමය හා මිනිසෙකු විසින් තවත් මිනිසෙකු සූරාකෑම ද ජාතියක් විසින් තවත් ජාතියක් සූරාකෑම ද අකාමකා දැමීම, ජන සමාජය එකිනෙකාට ප්‍රතිවිරුද්ධ පන්ති වශයෙන් භේදභින්න වීම අවසන් කිරීම මහජනයාගෙන් අති විශාල වැඩ කොටසෙහි ශුභ සිද්ධිය තකා හස්තයෙන් හා මොළයෙන් වැඩ කරන සංවිධානය වූ කම්කරු ජනයාගේ නායකත්වයෙන් රට පාලනය කිරීම.

(ආ) නිෂ්පාදනයේ සහ හුවමාරුවේ ප්‍රධාන මාර්ගයන් පුද්ගලිකයින් හෝ පුද්ගලයින්ගෙන් සමන්විත කණ්ඩායම් මගින් අයිතිකැර ගැනීම වෙනුවට ඒවා සම්පූර්ණ ජන සමාජය විසින් අයිතිකැර ගැනීම.

(ඉ) පුද්ගලයන්ගේ හෝ කොම්පැණිවල පුද්ගලික ලාභය උදෙසා නිෂ්පාදනය සංවිධානය කිරීම වෙනුවට සියලු ද්‍රව්‍යයන්ද, රටේ ඇති නිෂ්පාදනීය හා විශ්‍රාණීය උල්පත් මහජනයාගේ වුවමනාවන් පිරිමසාලීම උදෙසා ක්‍රමානුකූලව සකස් කිරීම. මේ අන්දමට සෑම පුරවැසියෙකුට නිදහසත්, සුරක්ෂිත භාවයත්, වැඩ කිරීමට හා විවේක සුවය ලැබීමට අයිතිවාසිකමත් අනුක්‍රමයෙන් ඉහළ නගින්නා වූ ජීවන තත්ත්වයක් සහ නිදහස් හා ප්‍රීතිමත් ජීවිතයක් ලබාගැනීමට එක සමාන ප්‍රස්ථාවක් ද ලැබෙන්නේ ය.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය වෙනුවට ලංකා ස්වාධීන ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුවක් ඇතිවිය යුතු බව කොමියුනිස්ට් පක්ෂය කල්පනා කරයි. ඒ සමූහ ආණ්ඩුවේ ව්‍යවස්ථාව සර්වජන ඡන්දයෙන් තෝරා පත්කරනු ලබන ආණ්ඩුක්‍රම සම්පාදක මන්ත්‍රණ සභාවක් විසින් ස්වාධීන ලෙස කෙටුම් පත් කළ යුතු ය. මේ ව්‍යවස්ථාවට වෙනත් දේවල් හැර, පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු ය.

1. ලංකාවේ පුරවැසියන්ට සමානත්වය දීම,
2. ලංකාවේ සිටින විවිධ ජාතීන්ට දේශපාලන සමානත්වය දීම
3. කථා පැවැත්වීමේද, පුවත් පත් පැවැත්වීමේද, රැස්වීම් පැවැත්වීමේ හා සමිති සමාගම් සෑදීමේ ද හෘද සාක්ෂියට එකඟව ආගම ඇදහීම ඇතුලු කල්පනා කිරීමේද, නිදහස දීම.
4. සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී හා කම්කරු සමිති අයිතිවාසිකම් දීම.
5. සිංහල භාෂාව හා ද්‍රවිඩ භාෂාව රජයේ භාෂාවන් වශයෙන් යෙදීම.
6. එකමුතු කරන ලද නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම
7. එකමුතු කරන ලද සමාජ ජීවිත සහතික ක්‍රමයක් හා සුරක්ෂිතා ක්‍රමයක් ඇති කිරීම.
8. එකමුතු කරන ලද රජයේ වෛද්‍ය මෙහෙයක් ඇති කිරීම
9. වැඩ කිරීමට අයිතිවාසිකම හෝ රක්ෂා රහිත වූ විට රජයේ ආධාර ලැබීම.

10. පෘතුල ආර්ථික වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදවීමෙන් අනු ක්‍රමයෙන් ඉහළ නගින්නා වූ ජීවන තත්ත්වයක් ලබාදීම. මේ ආර්ථික වැඩ පිළිවෙලට පහත දැක්වෙන දෑ ඇතුලත් විය යුතුය.

(අ) ප්‍රධාන කර්මාන්තයන්ද, ගමනා ගමනය හා බඩු එහා මෙහා ගෙනයාමද විශාල වතු ද ජාතිය සන්තක කිරීම.

(ඇ) සැලැස්මක් අනුව රටේ කර්මාන්ත දියුණු කිරීම.

(ඉ) සමූපකාර ක්‍රමයට අයත් සියලු අංශයන්ට ම, රජයේ ආධාරදීම,

(ඊ) කෘෂිකර්මයට යන්ත්‍ර පාවිච්චි කිරීම හා එය සංවර්ධනය කිරීම, ගොවි ජනතාවට ඉඩම් හා රජයේ වෙනත් ආධාර දීම, සමූපකාර ක්‍රමයට ගොවිතැන් කිරීමට අනුබල දීම.

(උ) විදේශීය වෙළඳාම පිළිබඳ ඒකාග්‍රතාවය (සම්පූර්ණ අයිතිය හා බල පැවැත්ම) ලංකාණ්ඩුව අතට ගැනීම.

ලංකා ඉන්දියානු ගැටළුව ප්‍රජාතන්ත්‍රවාදී සමතයකට පත් කරනු පිණිස කොමියුනිස්ට් පක්ෂය පහත සටහන් යෝජනයක් ඉදිරිපත් කරයි.

1. ලංකාවේ ජාතික අයිතිවාසිකම් රැකෙනුයේ ලංකා ආණ්ඩුව විසින් මේ දිවයිනට එන පිටරැටියන්ගේ පැමිණීම පාලනය කළ යුතු ය.
2. ඉන්දියානු කම්කරුවන්ගේ ඡන්දය පිළිබඳ අවහිරකම් ඇතිකොට තිබෙන නුමුදු ඇතැම් දේපල හා ඉගැනීමේ සුදුසුකම් ඇති ඉන්දියානු සහ බ්‍රිතාන්‍ය ධනපතියන්ට මෙහි සමසක පදිංචියකින් පසු ඡන්ද බලය පැවරීමේ වර්තමාන ක්‍රමය අවසන් කළ යුතු ය. මේ දිවයිනේ සමසක පදිංචියක් ඇති පිටරටවලින් ගෙන්වන කම්කරුවන්ට ඡන්ද බලය පැවරිය යුතු ය.
3. දැනට ලංකාවේ පදිංචිව සිටින්නා වූ ද ඉන්දියාවේ පුරවැසි භාවය අත්හැර දමන්නා වූ ද ලංකාවේ පුරවැසි භාවය පිළිගැනීමට සතුට ඇති අයට ලංකාවේ පුරවැසියන් වීමට බලය දිය යුතු ය.

සුළු ජාතීන් වෙනුවෙන් සෑහෙන පමණ නියෝජිතයන් පත්වීම සහතික කරනු පිණිස බහු මන්ත්‍රී ආසනවල සංඛ්‍යාව වැඩිකරන ලෙස ප්‍රමාණය අනුව නියෝජිතයන් යැවීම ඉදිරිපත් කරන ලෙසද කොමියුනිස්ට් පක්ෂය අවවාද කරයි.

එකම කම්කරු සමිති ව්‍යාපාරයක් ලංකාවේ ගොඩනැගීමට ද කොමියුනිස්ට් පක්ෂය බලාපොරොත්තු වෙයි. සතලිස් දහසකින් යුත් ලංකා කම්කරු සමිති සම්මේලනය ගොඩ නැගීමෙහි කොමියුනිස්ට්වාදීහු පුරෝගාමීව ක්‍රියා කොට තිබේ. මේ සම්මේලනය පමණක් ලංකාවේ කම්කරු පන්තිය වෙනුවෙන් සත් කෝටියකගෙන් යුත් ලෝක කම්කරු සමිති සම්මේලනයෙහි පෙනී සිටී. ලංකා කම්කරු සමිති සම්මේලනය මගින් කම්කරු පන්තිය ඉල්ලීම් රැසක් දිනා ගෙන තිබේ. ඉන් සමහරක් මෙසේයි.

1. වැටුප් මණ්ඩල (වේජස් බෝර්ඩ්) පිහිටුවීම.
2. බොහෝ කර්මාන්තයන්හී යුද්ධයට පෙර ගෙවුන දිනකට ශත 60 වෙනුවට දිනයකට රු. 1.24 අඩුම මූලික පඩිය නිත්‍යානුකූල කිරීම.

3. යුද්ධයෙන් පෙර තිබුණු පැය 9-10 දවස වෙනුවට පැය 8 දිනය ලබාගැනීම.
4. යුද්ධයෙන් පෙර පඩිපිට කිසිම කිවාඩු දිනයක් නොමැති වූ නුමුදු දැන් අවුදරුද්දකට පඩි පිට නිවාඩු දින 33 ක් ලබා ගැනීම.

**66 වසරක ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ජාතික සමුළු**

| | | |
|---|---|---|
| **ආරම්භක සමුළුව** | 1943 | එක්සත් සමාජවාදී පක්ෂය විසුරුවා හැරීම සහ කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීම |
| **පළමුවන සමුළුව** | 1945 | පළමුවරට විදේශ සහෝදර කොමියුනිස්ට් පක්ෂ වල සහභාගීත්වය, සොල්බරි කොමිෂම වර්ජනය කිරීම, පූර්ණ නිදහස ඉල්ලා සිටීම |
| **දෙවන සමුළුව** | 1948 | යටත් විජිත රටවල නිදහස් අරගල වලට සහයෝගය වාම හා ප්‍රගතිශීලී පෙරමුණක අවශ්‍යතාවය |
| **තෙවන සමුළුව** | 1949 | චීන විප්ලවයේ තීරණාත්මක අවස්ථාව, පක්ෂය තුළ වාම ප්‍රවනතාවය |
| **සිව්වන සමුළුව** | 1950 | විප්ලවයේ අවධිය, ජාතික ධනේෂ්වර පන්තිය පිළිබඳ විග්‍රහය, එක්සත් පෙරමුණු න්‍යය, යූ.එන්.පී. විරෝධී පෙරමුණක අවශ්‍යතාවය |
| **පස්වන සමුළුව** | 1955 | 'ඉදිරිමග' ප්‍රකාශයට පත් කිරීම |
| **සයවන සමුළුව** | 1960 | ශ්‍රී ල.නි.ප - ල.ස.ස.ප - කො.ප සමගියක අවශ්‍යතාවය |
| **සත්වන සමුළුව** | 1964 | වාමාංශික එක්සත් පෙරමුණ පිහිටුවීම |
| **අටවන සමුළුව** | 1972 | සමගි පෙරමුණු රජයේ ගමන් මග |
| **නවවන සමුළුව** | 1975 | පක්ෂය එක්සත් කිරීම, ජාතික ප්‍රශ්නය පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම |
| **දසවන සමුළුව** | 1978 | විවෘත ආර්ථිකය, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නව අභියෝග |
| **එකොළොස්වන සමුළුව** | 1981 | 1980 වැඩවර්ජනය කම්කරු පන්තියේ මර්දනය, ජාතික සමගියේ අවශ්‍යාතාවය |
| **දොළොස්වන සමුළුව** | 1984 | 1983 කළු ජූලිය හා මර්දනය, ජාතික සමගිය |
| **දහතුන් වන සමුළුව** | 1987 | ඉන්දු - ලංකා ගිවිසුම, උතුරේ සහ දකුණේ ත්‍රස්තවාදය |
| **දහහතරවන සමුළුව** | 1991 | ආණ්ඩු වෙනසක් සඳහා අරගලය |
| **පහළොස්වන සමුළුව** | 1994 | වම ඒකත්ව කිරීමේ අවශ්‍යතාවය, සමාජවාදී කඳවුර බිඳ වැටීම පිළිබඳ විග්‍රහය |
| **දහසයවන සමුළුව** | 1998 | ආණ්ඩුව තුළ ක්‍රියා කිරීමේදී පක්ෂයේ අනන්‍යතාවය රැකගැනීම, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ ක්‍රියා කිරීම |
| **දහහත්වන සමුළුව** | 2002 | නව ලිබරල්වාදය පිළිබඳ විග්‍රහය, වමේ සමගියේ අවශ්‍යතාවය |
| **දහඅටවන සමුළුව** | 2006 | සමාජවාදී ජනතා පෙරමුණ පිහිටුවීම |

**66 වසරක ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරු**

| නම | කාලය | ප්‍රධාන සිද්ධීන් |
|---|---|---|

| | | |
|---|---|---|
| **පීටර් කේනමන්** | 1943 – 194.. | |
| **හැරී අබේගුණවර්ධන** | | |
| **ඒ.වෛත්‍යලිංගම්** | 1948 -1950 | |
| **එස්.ඒ.වික්‍රමසිංහ** | 1950-1955 | |
| **පීටර් කේනමන්** | 1955 -19 | |
| **කේ.පී.සිල්වා** | 19... | |
| **රාජා කොල්ලුරේ** | 1995-2001 | |
| **ඩිව් ගුණසේකර** | 2001 | |

**<u>ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු</u>**

- **දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ**
- **පීටර් කේනමන් 1947 දී මැද කොළඹ මන්ත්‍රීවරයා**
- **පී. කන්දයියා 1956 දී පේදුරුතුඩුව මන්ත්‍රීවරයා**
- **ප්‍රේමලාල් කුමාරසිරි** 1947 පළමුවැනි පාර්ලිමේන්තු මැතිවරණය හක්මන ආසනය
  ඔහු ප්‍රවීන මාධ්‍යවේදියෙක්, ගත් කතුවරයෙක්, දක්ෂ පරිවර්තකයෙක්, ව්‍යක්ත කථිකයෙක්, තියුණු දේශපාලන විචාරකයෙක්, ගුරුවරයෙක්, පර්යේෂණාත්මක ගවේෂකයෙක්, දේශපාලන න්‍යාචාර්යවරයෙක් හා පුරෝගාමී සටන්කාමී වෘත්තීය සමිති නායකයෙක් විය.

- **හැරී අබේගුණවර්ධන යි.** 1947 පළමුවන මහා මැතිවරණය, මාතර ආසනය
  ඔහු 1948-1949 තුළ කොමියුනිස්ට් පක්ෂයේ ඉහළම තනතුර වන ප්‍රධාන ලේකම් තනතුරට පත්විය. සිංහල, ඉංග්‍රීසි, පාලි, සංස්කෘත හා ලතින් භාෂා පිළිබඳ ගැඹුරු දැනුමක් තිබූ හැරී අබේගුණවර්ධනගේ නායකත්වයෙන් කම්කරු අරගල ගණනාවක් එම වකවානුව තුළ සිදුවිය. මින් 'ගස්නාව අරගලය' කම්කරු පන්ති ඉතිතහාසයට එක්වූ ප්‍රචණ්ඩ අරගලයෙකි. ගස්නාව වත්තේ පැවැති වැඩවර්ජනය කෙළවර වූයේ එම වත්ත වතු කම්කරුවන්ගේ පාලනයට ගනිමිනි.

- **විල්සන් වික්‍රමසිංහ,** 1947 අකුරැස්ස ආසනය
- **මහානාම සමරවීර,** 1952 දී මාතර ආසනය
- **ඩොරීන් වික්‍රමසිංහ,** 1952 අකුරැස්ස ආසනය

- **බි.වයි.තුඩාවේ ය.** 1965 සහ 1970 මහා මැතිවරණවලින් ජයග්‍රහණය කොට මාතර ආසනය
  අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යවරයකු සහ පළාත් සභා ඇමැතිවරයකු වූ ඔහුගේ වෘත්තීය ආරම්භ වූයේ ගුරුවරයෙකු ලෙස ය. යටත් විජිත සමයේ ලංකා ජාතික සංගමයේ මාතර දිසා ලේකම්වරයා වූ තුඩාවේ පසුව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට එක්ව, පක්ෂයේ මාතර දිසා ලේකම්වරයා වශයෙන් සහ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් ක්‍රියා කෙළේ ය.

- **පර්සි වික්‍රමසිංහ** 1956 - 1960 කඹුරුපිටිය ආසනය
- **සරත් මුත්තෙට්ටුවේගම** 1970 කළවාන ආසනය

- **නීතිඥ ඊලියන් නානායක්කාර** 1970-1977 දක්වා කඹුරුපිටිය ආසනය
- **ඩිව් ගුණසේකර** 1986-1989 දක්වා කළවාන ආසනය
  2004 ජාතික ලයිස්තු මන්ත්‍රී, ව්‍යවස්ථාකටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය අමාත්‍ය
- **නීතීඥ ඊ.ඒ.සමරසිංහ** 1994-1999 මාතර දිස්ත්‍රිකය
- **නීතීඥ චන්ද්‍රසිරි ගජදීර** 2004 මාතර දිස්ත්‍රිකය

**<u>ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හා සම්බන්ධ වෘත්තීය සමිති නායකයෝ</u>**

- **එම්.ජී.මෙන්ඩිස්**

**<u>ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සමිති නායකයෝ</u>**

- **සරත් මුත්තෙට්ටුවේගම**
- **ජයතිලක සිල්වා ??**

**<u>ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ කාන්තා සමිති නායකයෝ</u>**

- **නන්දා සිල්වා**

**<u>ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් දිවි පිදූ සාමාජිකයෝ</u>**